Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පුනරීක්ෂණ අභ්‍යාස

ගඩොල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සචින්ත තම කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකුට ලබා දී ඇත. තම කාර්යාලය ස්ථාවර ශක්තිමත් බැම්මක් යොදා ඉදිකරන ලෙස සචින්ත කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත.

1) ඉදිකිරීම සඳහා අවශ්‍ය ගඩොල් ඔහු තම ව්‍යාපාරය තුල නිපදවයි නම් ඒ සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය වල තිබිය යුතු ලක්ෂණ මොනවාද? ( ½ x 4 )

2) මෙ සඳහා ඔබ යෝජනා කරන බිත්ති වර්ගය කුමක්ද? පළමු වරිය සහ දෙවන වරිය සැලැස්ම ගඩොල් 6ක් දිගට ඇඳ පෙන්වන්න. (2)

3) කොන්ත්‍රාත් කරු විසින් තෝරාගන්නා ගඩොල් වල තිබිය යුතු ලක්ෂණ මොනවාද? ( ½ x 4 )

4) ගඩොල් බිත්තිය බැඳීමට කොන්ත්‍රාත්කරු විසින් සපයාගත යුතු ආයුධ හා උපකරණ ලැයිස්තුවක් ලියන්න. ( ½ x 4 )

5) බැමි බැඳීමේදී ගඩොල් මත ක්‍රියාකරන භාරය වැඩි වර්ගඵලයක් හරහා ක්‍රියාකරවීමට යොදා ඇති උපක්‍රමය රූප සටහනක් ඇඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (2)